DOI: 10.31357/fhssmst.2014.00031

# පහතරට ශාන්තිකර්මයන්හි ප්‍රතීයමාන යක්ෂ විශ්වාස පිළිබඳ අධ්‍යයනයක්

ටී.ඒ චලනි ප්‍රභාෂ්වරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
05 MAY 2016
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා සංස්කෘතික අධ්‍යයන විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධනය යි.

2014

**අපේක්ෂකයාගේ ප්‍රකාශය**

මෙම නිබන්ධනය මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතාගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි මහත්මියගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද්දකි. එමෙන්ම එය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා හෝ ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

......................................

අත්සන

05 . 05 . 2016

දිනය

**උපදේශකවරුන්ගේ නිර්දේශය**

අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මෙම නිබන්ධනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි /කරමු.

පරීක්ෂකවරු දැක්වූ කරුණු සලකා සංශෝධනය කොට ඇත.

දිනය 2016 . 05 . 05

අත්සන ..........................

මහාචාර්ය ලයනල් බෙන්තරගේ

දිනය 2016 . 05 . 05

අත්සන ..........................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි

**පිදුම**

මා මෙලොවට බිහි කළ

දෙමාපියන්ටත්,

මා හට අවැසි ශක්තිය හා ධෛර්ය

ලබා දුන් ආදර අයියාටත්,

මෙම නිබන්ධනය සාර්ථක කර ගැනිමට

නිවැරදි මඟ පෙන්වීම ලබා දුන්

ලයනල් බෙන්තරගේ ගුරු පියාණන්ටත්

පුදමි

ගෞරවයෙන්............

**අනුක්‍රමණිකා**


| | |
|---|---|
| ග්‍රන්ථ නාම පිටුව | i |
| අපේක්ෂකයාගේ ප්‍රකාශය | ii |
| උපදේශකවරුන්ගේ නිර්දේශය | iii |
| පිදුම | iv |
| අනුක්‍රමණිකා | v-viii |
| අන්තර්ගතය | ix-x |
| සංකේත සූචිය | xi-xii |
| උපකාරානුස්මෘතිය | xiii-xvi |

**පළමු වෙනි පරිච්ඡේදය**

| | |
|---|---|
| 1. හැඳින්වීම, ක්‍රමවේදය හා මූලාශ්‍රය ඇගයීම | 1-17 |
| 1.1 විෂයානුබද්ධ පසුබිම | 1-7 |
| 1.2 පර්යේෂණ අභිමතාර්ථ | 7-8 |
| 1.3 පර්යේෂණ ක්‍රමවේදය | 8-11 |
| 1.4 පර්යේෂණ මූලාශ්‍රය ඇගයීම | 11-17 |
| 1.4.1 ලිඛිත මූලාශ්‍රය | |
| 1.4.2 අලිඛිත මූලාශ්‍රය | |

**දෙ වෙනි පරිච්ඡේදය**

| | |
|---|---|
| 2. ශ්‍රී ලාංකේය යක්ෂ විශ්වාසයන්හි ප්‍රභවය හා විකාශය | 18-64 |
| 2.1 ශ්‍රී ලාංකේය ඓතිහාසික තොරතුරු හා බැඳි යක්ෂ විශ්වාස | 18-32 |
| 2.1.1 වංශකථා ආශ්‍රිත | |
| 2.1.2 බෞද්ධ සාහිත්‍යය ආශ්‍රිත | |

2.2 බෞද්ධාගමික තොරතුරුවලින් ප්‍රතීයමාන යක්ෂ විශ්වාස 33-52

2.3 ආයුර්වේදය හා බැඳි යක්ෂ විශ්වාස 53-64

**තෙ වෙනි පරිච්ඡේදය**

3 පහතරට ශාන්තිකර්මයන්හි ප්‍රතීයමාන යක්ෂ විශ්වාස 65-185

3.1 උපත් කථා හා බැඳි යක්ෂ විශ්වාස 68-92

3.1.1 සූනියම් යක්ෂයාගේ උපත් කථා

3.1.2 සන්නි යකුන්ගේ උපත් කථා

3.1.3 රිද්දි යකුන්ගේ උපත් කථා

3.1.4 මහසොහොන් යක්ෂයාගේ උපත් කථා

3.1.5 කළු කුමාරයාගේ උපත් කථා

3.1.6 රීරි යක්ෂයාගේ උපත් කථා

3.1.7 කළු යකාගේ උපත් කථා

3.2 යක්ෂයෝ 93-137

3.2.1 සූනියම් යක්ෂයා

3.2.2 සන්නි යකුන්

3.2.3 මහසොහොන් යක්ෂයා

3.2.4 කළු කුමාරයා

3.2.5 රීරි යක්ෂයා

3.2.6 කළු යකා

3.2.7 අභිමාන යකා

3.2.8 තොට යකා

3.2.9 බිල්ලේ යකා

3.3 යක්ෂ විශ්වාස හා බැඳි පුද පූජා 138-160

3.3.1 සූනියම් යාගය

3.3.2 සන්නි යකුම

3.3.3 රිද්දි යාගය

3.3.4 මහසොහොන් සමයම

3.3.5 කළු කුමාර සමයම

3.3.6 ඉර මුදුන් සමයම

3.4 යක්ෂ විශ්වාස ශාන්තිකර්ම තුළ නිරූපිත ආකාරය 160-185

3.4.1 නාට්‍යමය අවස්ථා 161-185

3.4.1.1 සමාරෝපය හා අනුකරණය

3.4.1.2 සංවාද භාවිතය

**සිවු වෙනි පරිච්ඡේදය**

4 සමාජගත යක්ෂ විශ්වාස සහ අද්‍යතන ප්‍රවණතා 186-255

4.1 යක්ෂ විශ්වාස සමාජගත වීම කෙරෙහි බල පෑ සාධක 186-210

4.1.1 මිනිස් චින්තනය 187-210

4.1.1.1 කුතුහලය

4.1.1.2 වෛරය

4.1.1.3 කාමාශාව

4.1.2 යක්ෂ විශ්වාස ඇතුලත් ශාන්තිකර්මයන්හි කලාත්මක අගය 210-224

4.1.2.1 යාග සාහිත්‍යය

4.1.2.2 නර්තනය

4.1.2.3 රංග වස්ත්‍රාභරණ

4.1.2.4 වාදනය

4.1.2.5 සැරසිලි

4.2 සන්නිවේදන ක්‍රියාවලිය හා යක්ෂ විශ්වාස 224-239

4.2.1 සූනියම් යාගය

4.2.2 සන්නි යකුම

4.2.3 රිද්දි යාගය

4.2.4 මහසොහොන් සමයම

4.2.5 කළු කුමාර සමයම

4.3 යක්ෂ විශ්වාසයන්හි නූතන ප්‍රවණතා 239-255

4.3.1 සමාජ පිළිගැනීම

නිගමනය / සමාලෝචනය 256-263

උපග්‍රන්ථය 264-285

ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය 296-301

ඡායාරූප නාමාවලිය 302

ඡායාරූපාවලිය / චිත්‍රාවලිය 303-313

සංකේත සූචිය 313-316

## අන්තර්ගතය

පහතරට ශාන්තිකර්මයන්හි ප්‍රතීයමාන යක්ෂ විශ්වාස පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ සිදු කරන ලද මෙම නිබන්ධනය පරිච්ඡේද හතරකින් යුක්ත වේ. පළමු පරිච්ඡේදයේ දී මාතෘකාව හැඳින්වීම, ක්‍රමවේදය හා මූලාශ්‍රය අධ්‍යයනය පිළිබඳ කරුණු අවධාරණය කළ අතර ඒ මගින් පර්යේෂණයට පිවිසීමට උත්සහ ගනු ලැබී ය. මෙහි දී පර්යේෂණ අභිමතාර්ථ පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. මාතෘකාව හැඳින්වීමේ දී එහි සංකල්ප හඳුන්වා දෙමින් මාතෘකාවේ අතීත සමාජ අවශ්‍යතා ද කාලීන ප්‍රවණතාවය ද ක්ෂේත්‍ර වටිනාකම් හා එහි බලපෑම් පිළිබඳව ද කරුණු දක්වා ඇත. පර්යේෂණය පවත්වනු ලැබූ ක්‍රමවේදය හා දත්ත රැස් කිරීම සඳහා භාවිත කළ මූලාශ්‍රය පිළිබඳව ද කරුණු සඳහන් කරනු ලැබී ය.

දෙවන පරිච්ඡේදයේ දී ශ්‍රී ලාංකේය යක්ෂ විශ්වාසයන්ගේ ප්‍රභවය හා විකාශය කෙසේ සිදු වී ඇති දැයි යන්න පිළිබඳව අධ්‍යයනයක නිරත විය. එහි දී පළමුව යකුන් හා යක්ෂණියන් පිළිබඳ ඓතිහාසික තොරතුරු විස්තර කරනු ලැබී ය. එකල යකුන් හා යක්ෂණියන් පිළිබඳව ජනතාව තුළ පැවති බිය, සැකය ද ඒ නිසා ඇති වූ ඇදහිලි හා පුද පූජා ක්‍රමයන් මොනවාදැයි හඳුනා ගන්නට උත්සුක වුනෙමු. ශ්‍රී ලංකාවේ ආගමික විශ්වාසවලින් ද යකුන් හා යක්ෂණියන් පිළිබඳ තොරතුරු කියැ වේ. බුදු දහමේ යකුන් හා යක්ෂණියන් පිළිබඳව පෙන්වා දෙන කරුණු මෙම පරිච්ඡේදයේ දී වැදගත් වේ. එ බැවින් එහි එන යකුන් හා යක්ෂණියන් , ඔවුන්ගේ උපත් කථා, ජනතාවට ඇති කරනු ලබන වින දෝෂ, ඒවායෙන් මිදීමට සිදු කළ යුතු පූජා කර්ම  ආදිය ද හඳුනා ගනු ලැබී ය. එහි දී බුදු දහමේ කියැවෙන යක්ෂ විශ්වාස හඳුනා ගැනීමෙන් ඒවායේ යම් බලපෑමක් ශාන්තිකර්මවල එන යක්ෂ විශ්වාස සඳහා බලපා ඇති දැයි සොයා ගත හැකි විය.

ශ්‍රී ලාංකේය යක්ෂ විශ්වාසයන්ගේ ප්‍රභවය හා විකාශය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී දේශීය ආයුර්වේදයේ භූත විද්‍යා කොටස ද විමසා බැලීමෙන් යක්ෂ විශ්වාසවල විකාශය

සඳහා මෙහි දායකත්වය එහි ලා සිදු වි ඇති දැයි හඳුනා ගත හැකි විය. ජන සමාජය තුළ පැවති යකුන් හා යක්ෂණියන් පිළිබඳ විශ්වාස දේශීය ආයුර්වේදය සමඟ සම්බන්ධවීමත් ඉන් සිදු වූ වෙනස් වීමත් සෙවීම වැදගත් වූවකි.

තෙවන පරිච්ඡේදයේ දී පහතරට ශාන්තිකර්මයන්හි ප්‍රතීයමාන යක්ෂ විශ්වාස පිළිබඳ අධ්‍යයනය කරන්නට විය. එහි දී යකුන් උදෙසා පවත්වනු ලබන පහතරට ශාන්තිකර්ම මගින් මතු කෙරෙන යකුන් හා යක්ෂණියෝ , ඔවුන්ගේ උපත් කථා, පුද පූජා පිළිවෙත් ආදිය විමර්ශනය කර ඒ සියල්ලෙන් මතුවන යක්ෂ විශ්වාස සොයා බැලීමට උත්සුක වුනෙමු. ඒ අතර ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය අවස්ථාවල දී සමාරෝපය හා සංවාද භාවිත කිරීමේ දී යක්ෂ විශ්වාස මතු කෙරෙන අයුරු මෙම අධ්‍යයනයෙහිලා විමසුමට ලක් කරන්නට වීමු.

සමාජගත යක්ෂ විශ්වාස සහ අද්‍යතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීම සිව්වන පරිච්ඡේදයේ දී ඉටු කෙරිණ. යක්ෂ විශ්වාස ශාන්තිකර්ම විෂයෙහිලා සමාජගත වීමේ දී ඊට බල පෑ සාධක විමර්ශනය කිරීම එහිලා වැදගත් විය. මේ අනුව යක්ෂ විශ්වාස පුද්ගල මනස කෙරෙහි ක්‍රියා කර ඇති ආකාරය කෙසේ දැයි විමසා ඒ යටතේ කුතුහලය, වෛරය හා කාමාශාව ආදී චෛතසික බලපෑම් අධ්‍යයනය කරන්නට අමතක නොකළෙමු. තව ද යක්ෂ විශ්වාස සමාජගත වීමේ දී ශාන්තිකර්මවල කලාත්මක අගය ද ඒ සඳහා බලපෑ ආකාරය පිළිබඳව ද අධ්‍යයනය කිරීමට උත්සුක වුනෙමු. ඒ යටතේ ශාන්තිකර්මවල අන්තර්ගත ගායනය, වාදනය, නර්තනය හා සැරසිලි කලාවන්ගේ අගය පිළිබඳ විමසුමට ලක් කරන්නට විය. තව ද සන්නිවේදන ක්‍රියාවලිය හා සම්බන්ධ යක්ෂ විශ්වාස හඳුනා ගැනීමට ද යුහුසුළු වූ අතර අද්‍යතන සමාජයේ යක්ෂ විශ්වාස පවත්නා ස්වරූපය ද අධ්‍යයනය කෙරිණ. අවසාන වශයෙන් මෙම අධ්‍යයනය පිළිබඳව සමාලෝචනයක් ඉදිරිපත් කරමින් පැමිණිය හැකි නිගමනයන් සාරාංශව ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ය.

## සංකේත සූචිය

| | | |
|---|---|---|
| ඉ.ද. | - | ඉන්දීය දර්ශනය |
| කළු.පු.දා. | - | කළුකුමාරයා පුද ලබන දාරක වත් පිළිවෙත් |
| කළු.යා.පි. | - | කළුකුමාර යාග පිළිවෙළ |
| කු.මා.නි. | - | කුමාරකේලි ව්‍යාඛ්‍යාන සහිත මාධව නිධානය[1] |
| කු.රෝ.මා. | - | කුමාරකේලි ව්‍යාඛ්‍යාන සහිත රෝග විනිශ්චය හෙවත් මාධව නිධානය |
| ගු.වි.ගු. | - | ගුප්ත විද්‍යාව සහ ගුප්ත කර්ම |
| ජ.දෙ.ය. | - | ජන කවිය දෙවියෝ සහ යක්ෂයෝ |
| තොවි. | - | තොවිල් |
| දඹ.ක.භි. | - | දඹදෙණි කතිකාවත සහ භික්ෂු සමාජය |
| භා.ද.ඉ. | - | භාරතීය දර්ශන ඉතිහාසය |
| ප.ජා.පො. | - | පන්සිය පනස් ජාතක පොත් වහන්සේ |
| ප.සූ.ශා. | - | පහතරට සාම්ප්‍රදායික සූනියම් ශාන්තිකර්මය |
| ප.ශා.සා. | - | පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය |
| පි.මහ.පි. | - | පිරුවානා පොත් වහන්සේ හෙවත් මහ පිරිත් පොත |
| බෙ.ර.නාද. | - | බෙන්තර හා රයිගම ශාන්තිකර්ම නාද රටා |
| භූත. | - | භූතකරණය |
| මහ.ය.ක. | - | මහයක් කවි පොත |
| මහ.ස.වි. | - | මහසොහොන් සමයම් විමර්ශනය |
| මහා. | - | මහාවංශය |
| මැ.සූ.කැ. | - | මැණික්පාල ශාන්තිය හෙවත් සූනියම් කැපිල්ල |

[1] සටහන : නාමයේ අක්ෂර යොදා ඇත්තේ මුල් ග්‍රන්ථයේ සදහන් පරිද්දෙන් බව සැලකුව මනා ය.

| | | |
|---|---|---|
| රට.යා.වි. | - | රට යකුම් යාග විග්‍රහය |
| මෙ.ස. | - | මෙන්න සතුරා |
| රාමා. | - | රාමායණය |
| රී.සං.ස. | - | රිරියක් සංකල්පය හා සමාජය |
| ල.සාර.ස. | - | ලලිත කලා සාර සංග්‍රහය |
| ල.ජන.ය. | - | ලක්දිව ජනකථාවලින් හෙළිවන යකුන් පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් |
| වෛ.සා. | - | වෛදික සාහිත්‍යය |
| ස.න.ස. | - | සම්භාව්‍ය නර්තන සමීක්ෂා |
| ස.යාග.වි. | - | සන්නි යකුම් යාග විග්‍රහය |
| සිං.ගැ.නා. | - | සිංහල ගැමි නාටකය |
| සූ.ශා.ස. | - | සූනියම් කැපීමේ ශාන්තිකර්ම හා සමාජය |
| ශා.අ.විධි. | - | ශාන්තිකර්ම සහ අභිචාර විධි |
| ශා.සිං.ස. | - | ශාන්තිකර්ම හා සිංහල සමාජය |
| ශු.බ. | - | ශුද්ධ බයිබලය |
| 18.ස.සං. | - | 18 සන්නි සංවාද |

## උපකාරානුස්මෘතිය

මෙම පර්යේෂණ නිබන්ධනය සම්පාදනයේ දී නන් අයුරින් උදව් උපකාර කළ අය බොහෝ වෙති. මාගේ පශ්චාද් උපාධි පූරණය සඳහා පර්යේෂණ නිබන්ධන මාතෘකාව අනුමත කර දී ඒ සඳහා නිවැරදි මඟ පෙන්වීම ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සභාපති මහාචාර්ය ඥානදාස පෙරේරා ඇතුළු කාර්ය මණ්ඩලයත් භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රදීප් රත්නායක සහ හිටපු අංශ ප්‍රධාන මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ඇතුළු අධ්‍යයනාංශ කාර්ය මණ්ඩලයත් ඉතා ගෞරවයෙන් සිහිපත් කළ යුතු වේ.

මෙම අධ්‍යයනයේ දී අවශ්‍යය කරුණු පෙළගස්වමින් ආරම්භයේ සිට අවසානය දක්වාම මා හට සහය ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි සහ මේ සඳහා අවශ්‍ය වූ මාර්ගෝපදේශකත්වය මැනවින් ලබා දෙමින් නිවැරදි සාර්ථක පර්යේෂණාත්මක නිබන්ධනයක් සම්පාදනය කිරීමට මහත් වෙහෙසක් දරමින් මා මෙහෙය වූ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ මහාචාර්ය ලයනල් බෙන්තරගේ සිහිපත් කරන්නේ හදපිරි මහත් ගෞරවයෙනි. නිබන්ධනය ආරම්භයේ දී මාතෘකාව සකස් කර ගැනීමට තම පූර්ණ සහයෝගය ලබා දෙමින් කටයුතු කළ හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චින්තක බණ්ඩාර සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය මහින්ද විමලසිරිහට කෘතඥතා පූර්වක ස්තූතිය පුද කරමි.

මෙම නිබන්ධනය අධ්‍යයනය කිරීමේ දී අවශ්‍ය කරුණු පෙන්වා දෙමින් නිරතුරුවම මා දිරිමත් කළ මහාචාර්ය මුදියන්සේ දිසානායක මහත් ගෞරවයෙන් සිහිපත් කළ යුතු වේ.

මෙම පර්යේෂණ නිබන්ධනය ආරම්භයේ සිට අවසානය දක්වාම මා හට අවශ්‍ය දුර්ලභ ගණයේ වටිනා ග්‍රන්ථ ලබා දී උපකාර කළ බොහෝ පිරිසක් ද මේ අතර වෙති. ඒ අතරින් බෞද්ධ ආගමික යක්ෂ විශ්වාස සෙවීමේ දී ඇති වූ ගැටළු විස්තරාත්මකව

නිරාකරණය කර දෙමින් බෞද්ධ පොත් පත් ලබා දුන් පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ සිහිපත් කරන්නේ මහත් වූ ගෞරවයෙනි. දෙමටගොඩ මල්ලිකාරාම විහාරයේ හල්ගහවෙල්ලේ ධම්මවංස හිමියන් ද ගොතටුව පුරාණ කන්ද විහාරයේ නායක ස්වාමින්වහන්සේ ඇතුළු අනෙකුත් ස්වාමීන් වහන්සේලාත් අවශ්‍ය පොත පත හා ගැටළු නිරාකරණ කර දෙමින් දැක්වූ සහයෝගයට මාගේ නමස්කාරය පුද කරමි. විෂයානුබද්ධ කරුණු එක්රැස් කර ගැනීමේ දී වටිනා ග්‍රන්ථ රාශියක් මා වෙත ලබා දෙමින් බොහෝසේ උපකාර කළ වසන්ත ලාල් රණසිංහ කෘතවේදිව සිහිපත් කළ යුතු වේ. ක්‍රිස්තියානි ආගමික යක්ෂ සංකල්පය පිළිබඳ පැහැදිලි කර දීම් කරමින් අවශ්‍ය වටිනා ග්‍රන්ථ මා වෙත ලබා දුන් වජිරා ජයතිස්සට හදපිරි ස්තුතිය පුද කරමි. ඉතා වටිනා දේශීය ආයුර්වේද ග්‍රන්ථ හා ඒවා පැහැදිලි කර දෙමින් උපකාර කළ දේශීය වෛද්‍ය අනූෂා අබේපාල සිහිපත් කරන්නේ ගෞරවයෙනි.

පර්යේෂණ නිබන්ධනයට අදාළ තොරතුරු ගවේෂණයේ දී පුස්තකාල පරිහරණයට අවසර ලබා දෙමින් සහයෝගය දැක් වූ ජාතික පුස්තකාලය, කෞතුකාගාර පුස්තකාලය, ජාතික ලේඛනාරක්ෂක පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය පුස්තකාලය යන ආයතනයන්හි පුස්තකාලයාධිපතිවරු ඇතුළු කාර්ය මණ්ඩලයටත් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරිවරුන්ටත් කොළඹ ඥානාර්ථ ප්‍රදීපය ක්‍රිස්තියානි සංගමයේ නිලධාරිවරුන්ටත් කෘතඥතා පූර්වකව ස්තුතිය පුද කරමි.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අදාළව සිදු කළ සම්මුඛ සාකච්ඡා සඳහා පිළිතුරු ලබා දෙමින් ඒවා නිරාකරණය කර දුන් බොහෝ පිරිසක් ද සිටි. ක්‍රිස්තියානි ආගමික කරුණු විමසීමේ දී අවශ්‍ය පැහැදිලි කරදීම් කර දුන් කොස්වත්ත මරියා දෙව්මැදුරේ කිත්සිරි පියතුමන් ද කොච්චිකඩේ සෙන් ඇන්තනීස් දෙව් මැදුරේ ක්ලෙමන් පියතුමන් ද ගෞරවයෙන් සිහිපත් කළ යුතුව ඇත. හින්දු ආගමික යක්ෂ විශ්වාස පිළිබඳ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ දී

කරුණු ලබා දුන් නැදිමාලේ ශ්‍රී විෂ්ණු කෝවිලේ ස්වාමි රමණා හා ස්වාමි ශංකර් ද මෝදර කාළි කෝවිලේ බාලාස්වාමි ද කෘතවේදිව සිහිපත් කරමි. මිනිස් මනස හා පුද්ගල ශරීරාභ්‍යන්තර ක්‍රියාකාරිත්වය පැහැදිලි කර දුන් මා මිතුරු බටහිර වෛද්‍ය සම්පත් ද සිල්වා, දේශීය ආයුර්වේදය පිළිබඳව විස්තර කර දීම් සිදු කර දුන් වෛද්‍ය එල්.ඩී.ආර්. සෝමතිලකට ස්තූතිය පුද කරන්නේ ගෞරවය පෙරදැරිව ය.

පහතරට ශාන්තිකර්ම පුද පූජා පිළිබඳ පැහැදිලි කර දීම් කිරිමෙන් මා හට උපකාර කළ සියළුම ශාන්තිකර්ම ශිල්පීන්ටත් යකැදුරන්ටත් ගෞරවනීය ස්තූතිය පුද කරමි. මෙම අධ්‍යයනයේ දී යකුන් පිළිබඳ වටිනා කරුණු පැහැදිලි කර දෙමින් අවශ්‍ය උපත් කවි, ශ්ලෝක හා දිෂ්ටි මන්ත්‍ර, රූප සටහන් මා වෙත ලබා දෙමින් බොහෝ සෙයින් උපකාර කළ හර්ෂ මනෝරංජන සොහොයුරාට ස්තූතිය පුද කරන්නේ ගෞරවය පෙරදැරිව ය. ක්‍රිස්තියානි ආගමික විශ්වාස සෙවීමේ දී ගැටළු මතු වූ සෑම අවස්ථාවක දී ම ඒවා පැහැදිලිව නිරාකරණය කර දුන් ශ්‍රීයාන් සොහොයුරාට හදපිරි ස්තූතිය පුද කරමි.

මෙම අධ්‍යයනයේ ආරම්භයේ සිටම උපකාර කළ කථිකාචාර්ය පියනන්ද රූපසිංහ සිහිපත් කරන්නේ ද ගෞරවයෙනි. අධ්‍යයන කටයුතු කර ගෙන යෑමේ දී අවශ්‍ය නිවාඩු ලබා දෙමින් ද පොත්පත් ලබා දෙමින් ද සහය දැක්වූ ලයිසියම් ජාත්‍යන්තර පාසලේ නර්තන අංශ ප්‍රධාන රසික කොතලාවල හා නිශා කොතලාවල ද ප්‍රසාද්, චාමි, උදේශි ඇතුළු මාගේ සහෝදර ගුරු මණ්ඩලය ද ගෞරවයෙන් සිහිපත් කරමි. නිබන්ධනය සාර්ථක කර ගැනිමේ දී උපකාර කළ සුරංග, මාතොට, මහවත්ත, ජයම්පත්, පියුමි ද නිබන්ධනය යතුරු ලියනය කර දෙමින් කාරුණිකව සහයෝගය ලබා දුන් අනුරාධා පෙරේරා සහ සෝදුපත් බැලීමෙන් උපකාර කළ වසන්ත ලාල් රණසිංහ සිහිපත් කරන්නේ ද හද පිරි සෙනෙහසිනි. මෙම නිබන්ධනයට ඇතුළත් කරනු ලැබූ ඡායාරූපාවලිය සකස් කිරිමේ දී සහය දැක් වූ අජිත් හා හේමන්තිට ද ස්තූතිය පුද කරමි.